# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2123/31 – 2019 මැයි 14 වැනි අඟහරුවාදා – 2019.05.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/10/43/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

අංක 2116/24 දරන හා 2019.03.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් රඹුක්කන, කොටවැල්ල, ගබ්බල, පිටකොටුව පදිංචි ඒ. ජී. ජීවා පුෂ්පකුමාර මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, නො. 609, ප්‍රධාන කාර්යාලයේ හි පිහිටි ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3510 දරන හා 2019.01.04 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඒ. ජී. ජීවා පුෂ්පකුමාර මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20 (1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3510 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2020.03.26 දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05

පළමුවන උපලේඛනය

"අ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

*ලිපිනය* : ඒ. ජී. ජීවා පුෂ්ප කුමාර
පිටකොටුව, ගබ්බල
කොටවැල්ල, රඹුක්කන

*දිනය* : 2019.04.26

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය

2019.03.26 දිනැති අංක 2116/24 දරන *ගැසට් පත්‍රයේ* පල කරන ලද්දා වූ ද, ඒ. ජී. ජීවා පුෂ්ප කුමාර සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව බැඳී සිටින්නා වූ ද, 2019.01.04 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන :

පිටපත (අනෙක් පාර්ශවය) : ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
ප්‍රධාන කාර්යාලය, අංක 609,
දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.

05 - 782

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.